කොළඹ අති. දිසා විනිසුරු තිලක් නාඩෝ මැතිතුමන් ඉදිරිපිට දී,

සටහන් කිරීම: ජී. ජයසිංහ විසිනි.

දිසා අධිකරණ නඩු අංක:- 19849/1 එම්.ආර්.

2000.08.22.

## නි යෝ ග ය.

පැමිණිලිකරු විසින් ගොනු කර ඇති 99.05.12 දිනැති මෝෂම මගින් මෙම නඩුවේ 98.02.23 දින පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද විචාරණ මාලාවට විත්තිකරු විසින් පිළිතුරු සපයන ලෙසට ඉල්ලීමක් කර ඇති අතර, විත්තිකරු විසින් එම ඉල්ලීම සම්බන්ධයෙන් විරෝධතා ඉදිරිපත් කිරීමෙන් පසුව දෙපක්ෂයම ලිඛිත දේශණ ඉදිරිපත් කර ඇත.

මෙම නඩුවේ පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරනලද 98.02.23 දිනැති විචාරණ මාලාවට විත්තිකරු විසින් පිළිතුරු දිය යුතුද, යන්න පිළිබඳව

මෙම අධිකරණය විසින් පවත්වන ලද විමසීමකින් පසුව 98.07.30 දිනැති නියෝගය මගින් විචාරණ මාලාවට වින්තිකරු විසින් පිළිතුරු දීම අවශ්‍ය නැති බවට නියෝගයක් කර ඇත. අධිකරණය විසින් 98.07.30 දින කරන ලද නියෝගය මගින් විචාරණ මාලාව සම්බන්ධයෙන් කරන ලද නියෝගයට අමතරව ලේඛණ අනාවරණය කිරීම සඳහා පැමිණිලිකරු විසින් කරන ලද ඉල්ලීම පිළිබඳවද තවත් නියෝගයක් කර ඇත. ඒ අනුව 1998.07.30 දිනැති නියෝගය ඉල්ලීම් දෙකකට අදාලව කොටස් දෙකකින් යුක්තය. ලේඛණ අනාවරණය කිරීම සඳහා පැමිණිලිකරු විසින් කරන ලද ඉල්ලීම සම්බන්ධයෙන් එදින කරන ලද නියෝගය වින්තිකරුට එරෙහිව කරන ලද බැවින් වින්තිකරුගේ උත්තරය කපා හැර නඩුව ඒකපාක්ෂික විභාගය සඳහා නියම කරන ලදී.

වින්තිකරු විසින් එම නියෝගයට විරුද්ධව අභියාචනා අධිකරණය වෙත ප්‍රතිශෝධන ඉල්ලීමක් කරනලද අතර දිසා අධිකරණයේ 98.07.30 දිනැති නියෝගයේ ලේඛණ අනාවරණයකිරීම සඳහා කරනලද ඉල්ලීම පිළිබඳව කරන ලද නියෝගය පමණක් සලකා බැලූ අභියාචනා අධිකරණයවිසින් වින්තිකරු විසින් කරන ලද ඉල්ලමට ඉඩ දෙමින් 98.07.30 දිනැති දිසා අධිකරණයේ නියෝගය ඉවත් කර ඇත. ඉන් පසු පැමිණිලිකරු විසින් අභියාචනාධිකරණය විසින් දෙන ලද නියෝගයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවසර ලබා ගැනීම සඳහා ඉල්ලීමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද නමුත් පසුව එම ඉල්ලීම ඉවත් කරගෙන ඇත. ඒ අතරතුරදී පැමිණිලිකරු විසින් විචාරණ මාලාව සම්බන්ධයෙන් දිසා අධිකරණය විසින් දෙන ලද නියෝගය සම්බන්ධයෙන් අභියාචනයට ඉදිරිපත් කිරීමට අවසර ලබා ගැනීම සඳහා ඉල්ලීමක් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අතර එම ඉල්ලීම පිළිබඳව අභියාචනාධිකරණයේ පැවති

H 4793 - 1,000,000 (99/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

Tr. & Audit 141 a
(E 2° c.d.) 12/46



විමසීමේදී ඒ වන විටත්, විත්තිකරුගේ ඉල්ලීම මත දිසා අධිකරණයේ 98.07.30 දිනැති නියෝගය ඉවත් කර ඇති හේතුව මත පැමිණිලිකරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කර ඇත.

කෙසේ වෙතත් ඉන් පසුව හෝ පැමිණිලිකරු විසින්, දිසා අධිකරණය විසින් 98.07.30 දින කරන ලද නියෝගයේ විචාරන මාලාව සම්බන්ධයෙන් කරනලද නියෝගය ප්‍රතිශෝධනය කිරීම සඳහා ඉල්ලීමක් අභියාචනාධිකරණය වෙත කර නොමැත.

09 AUG 2000

දිසා අධිකරණයේ 98.07.30 දිනැතිනියෝගය විචාරණ මාලාව සහ ලේඛණ අනාවරණය කිරීම සඳහා පැමිණිලිකරු විසින් කරන ලද ඉල්ලීම් 2 ක් සම්බන්ධයෙන් කර ඇති නියෝග 2 ක් වුවද, අභියාචනාධිකරණය විසින් කරන ලද 1999.02.11 දින නියෝගයේ දිසා අධිකරණයේ 98.07.30 දිනැති නියෝගය ඉවත් කරන බව සඳහන් වී ඇතත්, දිසා අධිකරණය විසින් එකම දිනයේ කරන ලද නියෝග දෙකෙන් ලේඛණ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් විත්තිකරුට විරුද්ධව දෙන ලද නියෝගය ප්‍රතිශෝධනය කිරීම සඳහා විත්තිකරු විසින් කරන ලද ඉල්ලීම මත පමණක් අභියාචනාධිකරණය විසින් ඉහත කී 99.02.11 දිනැති නියෝගය කර ඇති බව පෙනී යයි.

නමුත් විචාරණ මාලාව සම්බන්ධයෙන් දිසා අධිකරණය විසින් කරන ලද නියෝගය අභියාචනාධිකරණයේ 99.02.11 දිනැති නියෝගය මගින් ඉවත් කිරීමක් සිදු කර නොමැත.

දිසා අධිකරණය විසින් විචාරණ මාලාව සම්බන්ධයෙන් පැමිණිලිකරුට විරුද්ධව දෙන ලද නියෝගය, ප්‍රතිශෝධනය ඉල්ලීමක් මත අභියාචනාධිකරණය විසින් එම කරුනට අදාලව දිසා අධිකරණයේ නියෝගය ඉවත්කිරීමක් සිදු කර නැති

බැවින්, දිසා අධිකරණය විසින් විචාරණ මාලාව සම්බන්ධයෙන් දෙන ලද 1998.07.30 දිනැති නියෝගය තවදුරටත් ඒ ආකාරයෙන්ම පවතිනු ඇත. එසේ හෙයින් පැමිණිලිකරුට නැවත වරක් එම විචාරන මාලාවට විත්තිකරු විසින් පිළිතුරු දෙන ලෙසට අධිකරණය විසින් නියෝගයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කිරීමට අයිතියක් නොමැත.

එසේ හෙයින් පැමිණිලිකරුගේ ඉල්ලීම නඩු ගාස්තුවට යටත්ව ප්‍රතික්ෂේප කරමි.

අත්/කලේ.

(තිලක් තාබෘ)

අති. දිසා විනිසුරු- කොළඹ.

20000.08.22.

:::::::::::::::::

ඉහතින් සඳහන් වන්නේ කොළඹ දිසා අධිකරණ නඩු අංක: 19849/එම්.ආර්. දරණ නඩුවේ කාර්ය සටහන් 27,33 සහ39 ද, 1998.07.30 වෙනි දිනැති නියෝගය සහ 2000.08.22 වෙනි දිනැති නියෝගයේ සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

RManam

රෙජිස්ට්‍රාර්.

රෙජිස්ට්‍රාර්/පිස්කල්
දිසා අධිකරණය
කොළඹ

යතුරු ලියනය කළේ: Green

සැසඳුවේ: Rem

B/20 974069
24 8 00

SRI LANKA 10.00

29 AUG 2000

කොළඹ-12.